සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 08	විෂයය / பாடம் / Subject: විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper: I ,II	කාලය / காலம் / Time: පැය 02යි.

නම :.. විභාග අංකය :....................................

සැලකිය යුතුයි :
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පොල්වතුර ස්වල්පයක් කදාවක් මතට ගෙන නිරීක්ෂණය කරනු ලබන ක්ෂුද්‍ර ජීවී වර්ගය කුමක් ද?

(1) බැක්ටීරියා
(2) වෛරස
(3) යීස්ට්
(4) දිලීර

(02) සීනි බහුලව ඇති ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් වැඩීම නිසා ඇතිවන වෙනස්වීම හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) පැසීම
(2) පූතිභවනය
(3) මුඩුවීම
(4) කුණුවීම

(03) අපෘෂ්ඨවංශී ජීවියකු වන්නේ පහත ජීවීන් අතුරින් කවරෙක් ද?


(1)


(2)


(3)


(4)

(04) උත්ස්වේදනය අවම කිරීමට පත්‍ර කටු බවට පත්ව ඇති ශාකයක් වන්නේ මින් කුමක් ද?

(1) අරලිය
(2) කස
(3) පතොක්
(4) නවහංදි

(05) වායව මුල්වල කාර්යය කුමක් ද?

(1) වාතය අවශෝෂණය
(2) ජලවාෂ්ප අවශෝෂණය
(3) ආහාර සංචිත කිරීම
(4) කඳට ආධාරකයක් සේ ක්‍රියා කිරීම.

EXAMRESULTS.LK

(06) මිනිස් කනෙහි ශ්‍රව්‍යතා සීමාව වන්නේ මින් කවරක් ද?

(1) 20 - 200 Hz
(2) 20 - 2000 Hz
(3) 200 - 20000 Hz
(4) 20 - 20000 Hz

(07) ඝන, ද්‍රව, වායු අතරින් පහසුවෙන් සම්පීඩනයට ලක්කළ නොහැකි ද්‍රව්‍ය වන්නේ මින් කවරක් ද?

(1) වායු
(2) ද්‍රව
(3) ඝන
(4) ද්‍රව හා ඝන

(08) විද්‍යුත් චුම්භක දැකගත හැකි වන උපකරණයකි.

(1) මාලිමාව
(2) පැන්ට්‍රි කබඩ් අගුළු
(3) විදුලි මෝටර
(4) දුරකථන කම්බි

(09) විභව අන්තරය මනින උපකරණය හා එහි මනිනු ලබන ඒකකය නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?

(1) ඇමීටරය - වෝල්ට්
(2) වෝල්ට් මීටරය - ඇම්පියර්
(3) වෝල්ට් මීටරය - වෝල්ට්
(4) ඇමීටරය - ඇම්පියර්

(10) භෞතික විපර්යාසයක් වන්නේ මින් කුමක් ද?

(1) ඉටි දැල්වීම.
(2) ජලය වාෂ්ප වීම.
(3) යකඩ මල බැඳීම.
(4) දර දහනය

(11) කොපර් සල්ෆේට් ද්‍රාවණයකට පිරිසිදු යකඩ ඇණයක් දමා රත්කළ විට ටික වේලාවක දී,

(1) යකඩ ඇණය නිල් පැහැ වේ.
(2) යකඩ ඇණය දුඹුරු පැහැ වේ.
(3) ද්‍රාවණයේ නිල් පැහැය අඩු වේ.
(4) ද්‍රාවණය දුඹුරු පැහැ වේ.

(12) දාහ්‍ය ද්‍රව්‍ය වාතයේ දහනය ආරම්භ වන උෂ්ණත්වය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) තාපාංකය
(2) ද්‍රවාංකය
(3) ජ්වලන අංකය
(4) හිමාංකය

(13) මිනිස් සමෙහි අජීවී සෛල වලින් සෑදී ඇති කොටස කුමක් ද?

(1) චර්මය
(2) අපිචර්මය
(3) මැල්පිගීය ස්ථරය
(4) ස්නේහස්‍රාවීය ග්‍රන්ථි

(14) ශාකවල ද්‍රව්‍ය පරිවහන ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?

(1) විසරණය (2) ආස්‍රැතිය

(3) ස්කන්ද ප්‍රවාහය (4) බිංදුදය

(15) මතකය, බුද්ධිය වැනි උසස් මානසික ක්‍රියා පාලනය කරනු ලබන මොළයේ කොටස වන්නේ,

(1) මස්තිෂ්කය (2) අනුමස්තිෂ්කය

(3) සුෂුම්නා ශීර්ෂකය (4) සුෂුම්නාව

(16) මිනිසාගේ සුෂුම්නා ස්නායු යුගල සංඛ්‍යාව කොපමණ ද?

(1) 12කි. (2) 24කි.

(3) 31කි. (4) 62කි.

(17) භූ ස්ථායි චන්ද්‍රිකා මගින් පෘථිවිය ආවරණය කිරීමට අවශ්‍ය අඩුම චන්ද්‍රිකා ගණන වන්නේ,

(1) 1කි. (2) 2කි.

(3) 3කි. (4) 4කි.

(18) පහත රූපයේ දැක්වෙන්නේ චන්ද්‍ර ග්‍රහනයක දී වැදගත් වන ග්‍රහ වස්තූයි. චන්ද්‍ර ග්‍රහනයක දී ඒවා පිහිටන ආකාරය අනුව P, Q, R පිළිවෙලින් දක්වා ඇත්තේ කුමන වරණයේ ද?



(1) R, Q, P (2) P, Q, R

(3) Q, P, R (4) P, R, Q

(19) වඩාත් කාර්යක්ෂම විදුලි බල්බ වර්ගය වන්නේ කුමක් ද?

(1) සුසංහිත ප්‍රතිදීප්ත පහන් (2) සූත්‍රිකා බල්බ

(3) ප්‍රතිදීප්ත පහන් (4) LED පහන්

(20) අකුණු පවතින අවස්ථාවක දී ගත හැකි සුදුසු ම ආරක්ෂිත ක්‍රියාමාර්ග කුමක් ද?

(1) එළිමහන් ස්ථානයකට යාම.

(2) පාපැදියකින් හැකි ඉක්මනින් ඉවත් වීම.

(3) ගොඩනැගිල්ලක් හෝ වාහනයක් තුළට යාම.

(4) විශාල ගසක් යටට යාම.

(ලකුණු 2 × 20 = 40)

II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4ට පිළිතුරු සපයන්න.

(01) (A) එක්තරා ශිෂ්‍ය කණ්ඩායමක් විසින් ශ්‍රමදානයක් අවසානයේ දී එකතු වූ කසල ද්‍රව්‍ය පුළුස්සන ලදී.

(i) කසල ද්‍රව්‍ය වල තිබිය හැකි දාහ්‍ය ද්‍රව්‍ය 2ක් ලියන්න. (ල. 1)

(ii) ගින්නක් ඇතිවීම සඳහා තිබිය යුතු සාධක 2ක් ලියන්න. (ල. 2)

(iii). ඉටිපන්දම් දැල්ලකින් පිටවන දහන ඵල දෙකක් ලියන්න. (ල. 2)

(iv) ඉහත ඔබ සඳහන් කළ දහන ඵල අතුරින් කවරක් මිහිතලය උණුසුම් වීම සඳහා බලපායි ද? (ල. 1)

(v) නිර්ජලීය කොපර් සල්ෆේට් භාවිතයෙන් හඳුනාගත හැක්කේ ඉහත (iii) හි ඔබ සඳහන් කළ ඵල අතුරින් කුමක් ද? (ල. 1)

(B) ඊයම් වල ද්‍රවාංකය 317°C ද, තඹ වල ද්‍රවාංකය 1083°C ද වේ.

(i) ඉලෙක්ට්‍රොනික උපාංග පෑස්සීමට ඊයම් මිශ්‍ර ලෝහයක් යොදා ගැනීමට හේතුවක් සඳහන් කරන්න. (ල. 1)

(ii) තඹ ලෝහය එදිනෙදා ජීවිතයේ දී යොදා ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 1)

(iii) තඹ හා මැටි වලින් සෑදූ සමාන භාජන දෙකකට උණු ජලය දැමූ විට ජලය ඉක්මනින් නිවෙන භාජනය කුමක් ද? (ල. 1)

(iv) මෙම ඇටවුමෙහි තඹ පතුරක් හා යකඩ හැන්දක් වියළි කෝෂවලට සම්බන්ධ කර ඇත. (ල. 1)

මෙහි දී ලැබෙන නිරීක්ෂණයක් ලියන්න.



(C) ඔබට පහත ද්‍රව්‍ය සපයා ඇත.

- LED බල්බයක්
- වියළි කෝෂ 2
- සම්බන්ධක කම්බි

LED බල්බය දැල්වීම සඳහා විද්‍යුලිය සපයන ආකාරය පෙන්වීමට සරල පරිපථයක් සංකේත භාවිතා කරමින් අඳින්න. (ල. 2)

(D) කසල පිලිස්සීමේ ක්‍රියාවලියේ දී එක් සිසුවකුගේ අතට තද උණුසුමක් ඇති විය.

(i) එම සංවේදනය සිසුවා ලබාගත් අවයවය කුමක් ද? (ල. 1)

(ii) එහි දී උණුසුම ලැබුන ස්ථානයෙන් අත ක්ෂණිකව ඉවතට ගැනීම සිදුවිය. මෙහි දී එම ක්‍රියාවට අදාළ මානව දේහ පද්ධතිය කුමක් ද? (ල. 1)

(iii) එම පද්ධතියේ ආරක්ෂාව සඳහා ඔබට ගතහැකි ක්‍රියා මාර්ගයක් දක්වන්න. (ල. 1)

(02) (A) ජීවීහු පරිසරය තුළ තම වර්ගයාගේ පැවැත්ම තහවුරු කර ගැනීමට චක්‍රානුකූල රටාවක් අනුගමනය කරයි. එම අවස්ථා අනුපිළිවෙල ජීවන චක්‍රයක් ලෙස හඳුන්වයි.

(i) ශාකයක ජීවන චක්‍රයක් ඇඳ පෙන්වන්න. (ල. 3)

(ii) ශාක ජීවන චක්‍ර අධ්‍යයනයෙන් මිනිසාට ඇති එක් වාසියක් සඳහන් කරන්න. (ල. 1)

(iii) ගොයම් වගාවට හානිකරන පලිබෝධක කෘමියකු හා ශාකයක් නම් කරන්න. (ල. 2)

(B) ආහාර වියළීම සඳහා සාදන ලද සූර්යය තාප වියලනයක් පහත දැක්වේ.



(i) මෙහි ආහාර තැන්පත් කරන ස්ථානය කුමක් ද? (ල. 1)

(ii) ආහාර කල්තබා ගැනීම සඳහා මෙම වියලනය භාවිතයෙන් ලැබෙන එක් වාසියක් සඳහන් කරන්න. (ල. 1)

(iii) මෙම වියලනය තුළ දී ආහාරයේ කුමන වෙනසක් සිදුවේ ද? (ල. 2)

(iv) ඉහත උපකරණය හැර ආහාර පරිරක්ෂණය කරගත හැකි වෙනත් ක්‍රමයක් උදාහරණ සහිතව ලියන්න. (ල. 1)

(03) මෙහි දැක්වෙන්නේ සෞරග්‍රහ මණ්ඩලයක රේඛා සටහනකි.



(i) මෙහි ADF නම් කරන්න. (ල. 3)

(ii) දී ඇති දින දර්ශනය අනුව, ජූලි මාසය සඳහා පසලොස්වක දින 2ක් යෙදී ඇත. (ජූලි 2 හා ජූලි 31) මෙහි අමාවක දිනය යෙදෙන්නේ කවදාට ද? (ල. 1)

ජූලි						
ස	අ	බ	බ්‍ර	සි	සෙ	ඉ
*	*	1	2	3	4	5
6	7	8	9	10	11	12
13	14	15	16	17	18	19
20	21	22	23	24	25	26
27	28	29	30	31		

(iii) මෙම මාසයේ 9වන දින ඇතිවිය හැකි චන්ද්‍රකලාව කුමක් ද? (ල. 1)

(iv) සූර්යග්‍රහනයක් ඇතිවන ආකාරය ඇඳ පෙන්වන්න. (ල. 3)

(v) ජල රොකට්ටුවක් සෑදීමට ඔබ භාවිත කළ ද්‍රව්‍ය මොනවා ද? (ල. 2)

(vi) ඇමරිකානු අභ්‍යවකාශ වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනයේ නම කුමක් ද? (ල. 1)

(04) (A) පහත දී ඇති ද්‍රව්‍ය භාවිතයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- පිරිසිදු ලුණු ද්‍රාවණය
- සල්ෆර්
- පස්
- පිරිසිදු සීනි
- රසදිය
- යකඩ

(i) ඉහත සඳහන් ද්‍රව්‍ය අතුරින් මූලද්‍රව්‍ය 2ක් නම් කරන්න. (ල. 2)

(ii) සංශුද්ධ ද්‍රව්‍යයන් 2ක් නම් කරන්න. (ල. 2)

(iii) සංයෝගයක් ලියන්න. (ල. 1)

(iv) මෙහි අඩංගු උෂ්ණත්වමාන ද්‍රවයක් ලෙස භාවිතා වන මූලද්‍රව්‍ය කුමක් ද? (ල. 1)

(v) ඉහත ද්‍රව්‍ය අතර නොමැති පදාර්ථයේ අවස්ථාව කුමක් ද? (ල. 1)

(vi) දිලීර නාශකයක් ලෙස යොදා ගන්නා ද්‍රව්‍ය කුමක් ද? (ල. 1)

(vii) ආහන්‍යතාව දක්වන ද්‍රව්‍යයක් සඳහන් කරන්න. (ල. 1)

(B) පහත දක්වා ඇති පදාර්ථ හා සම්බන්ධ සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.



(ල. 2)

(05) (A)



(i) ඉහත රූපයේ දැක්වෙන ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට අදාල ශක්ති ප්‍රභවය කුමක් ද? (ල. 1)

(ii) රූපයේ දැක්වෙන ක්‍රියාවලියට අදාලව වචන සමීකරණයක් ඉදිරිපත් කර ඇත. මෙහි A සංයෝගය හඳුනාගෙන ලියන්න. (ල. 1)

කාබන්ඩයොක්සයිඩ් + ජලය $\xrightarrow[\text{හරිතප්‍රද}]{\text{ආලෝක ශක්තිය}}$ ......A......+ ඔක්සිජන්

(iii) ඉහත ක්‍රියාවලියේ දී පිටවන වායුව වායුගෝලයේ පවතින අනුපාතය කුමක් ද? (ල. 1)

(B)



(i) ඉහත ඇටවුමේ දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද? (ල. 2)

(ii) මෙම ඇටවුම ශාකයක කුමන ජීව ක්‍රියාවලියක් ආදර්ශනය කිරීමට භාවිතා කරයි ද? (ල. 2)

(C)



(i) ඉහත ඇටවුමේ ඇති කුඩළු පැලය ටික වේලාවකින් රතු පැහැ විය. ශාකය රතු පැහැවීමට අදාළ විද්‍යාත්මක සංසිද්ධිය කුමක් ද? (ල. 2)

(ii) උදෑසන කාලයේ දී තෘණ පිටියක තෘණ ශාක පත්‍ර අග්‍රවල පත්‍ර අග්‍රයෙන් ජලය පිටතට වෑස්සෙන බව දැක ගත හැකි විය. මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ කෙසේ ද?

(06) (A) පාරිභෝගියකු වශයෙන් ක්‍රමවත් හා ආකර්ශනීය ආහාර ඇසුරුම් කෙරෙහි ද අප සැලකිලිමත් විය යුතුය.

(i) ආහාරයක ගුණාත්මක බව හඳුනාගැනීම සඳහා ලේබලයක තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න. (ල. 2)

(ii) උෂ්ණත්ව පාලනය ද ආහාර පරිරක්ෂණය සඳහා යොදාගනු ලබන ක්‍රමයකි. එහි ආකාර 2 නම් කරන්න. (ල. 2)

(iii) ආහාර පරිරක්ෂක ලෙස යෙදීමට නිර්දේශිත රසායන ද්‍රව්‍ය 2ක් නම් කරන්න. (ල. 2)

(iv) ආහාර ඇසුරුමක SLS තත්ව සහතිකය නිකුත් කරනු ලබන ආයතනය කුමක් ද? (ල. 1)

(B) (i) පලිබෝධකයන් ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද? (ල. 1)

(ii) පලතුරු මැස්සාගේ ජීවන චක්‍රයේ ප්‍රධාන අවධි 4 නම් කරන්න. (ල. 2)

(iii) රසායනික පලිබෝධ නාශක යෙදීමෙන් පරිසරයට සිදුවන හානියක් සඳහන් කරන්න. (ල. 1)

(07) (A) ස්වභාවික හේතු නිසා ඇතිවන ආපදා තත්වයක රේඛීය සටහනක් පහත දක්වේ.



(i) මෙහි A හා B ලෙස නම් කර ඇති අකුණු වර්ග දෙක නම් කරන්න. (ල. 2)

(ii) ජීවිත හා දේපළවලට හානිකර වන්නේ ඉහත දක්වූ කවර අකුණු වර්ගය ද? (ල. 1)

(iii) අකුණු සහිත කාලගුණයක් පිළිබඳව අනාවැකි ප්‍රකාශ වූ විගස අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයක් ලියන්න. (ල. 1)

(B) රත්නපුර, කළුතර, ගාල්ල, මාතර යන ප්‍රදේශ ස්වභාවික ආපදා වලට ලක්වීමට ඇති සම්භාවිතාව වැඩිය.

(i) රත්නපුරය, කළුතර ප්‍රදේශවලට බලපෑ හැකි ස්වභාවික ආපදාවක් ලියන්න. (ල. 1)

(ii) ස්වභාවික විපත් සඳහා බලපාන හේතු 2ක් ලියන්න. (ල. 2)

(iii) එල්-නිනෝ සංසිද්ධිය සඳහා බලපාන සාධකය කුමක් ද? (ල. 1)

(C) (i) අහසෙහි පිහිටීම වෙනස් නොවන තාරකාව කුමක් ද? (ල. 1)

(ii) රාත්‍රී අහසෙහි උතුරු දිශාව හඳුනා ගැනීමට භාවිත කළ හැකි තාරකා මණ්ඩලය කුමක් ද? (ල. 1)

(iii) ඔබ සාදන ලද ආනතිමානයක වැදගත්කම කුමක් ද? (ල. 1)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade 08	විෂයය / பாடம் / Subject විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper I ;II	පිළිතුරු

I කොටස

01. 3	06. 4	11. 3	16. 3
02. 1	07. 4	12. 3	17. 3
03. 2	08. 3	13. 2	18. 4
04. 3	09. 3	14. 4	19. 4
05. 2	10. 2	15. 1	20. 3

(ලකුණු 2 X 20 = 40)

II කොටස

01. A (i) නිවැරදි පිළිතුරු 2ක් සඳහා (ල. 1)
(ii) දාහ්‍ය ද්‍රව්‍යක් තිබීම/දහන පෝෂකයක් (O_2) ලැබීම./ජ්වලන උෂ්ණත්වයට රත් වීම. (ල. 2)
(iii) CO_2 හා ජලවාෂ්ප (ල. 2)
(iv) CO_2 (ල. 1)
(v) $H_2O_{(g)}$/ජල වාෂ්ප (ල. 1)

B (i) තාපාංකය අඩුකරන නිසා (ල. 1)
(ii) ගැළපෙන නිවැරදි පිළිතුරකට (ල. 1)
(iii) තඹ (ල. 1)
(iv) හැන්ද දුඹුරුපාට වීම (ල. 1)

C නිවැරදි පරිපථයට (ල. 2)



D (i) සම (ල. 1)
(ii) ස්නායු පද්ධතිය (ල. 1)
(iii) මානසික ආතතිය පාලනය කිරීම/ ක්‍රීඩා හා ව්‍යායාම කිරීම. නිවැරදි ඉරියව් පවත්වා ගැනීම, නිසි පෝෂණය, බුද්ධි වර්ධක අභ්‍යාස වල නිරත වීම ආදී නිවැරදි පිළිතුරකට (ල. 1)

(මුළු ලකුණු 16)

02. A (i) ශාකයක ජීවන චක්‍රයේ අවස්ථා 3 පිළිවෙලින් දක්වන චක්‍රමය සැකිල්ලකට (ල. 3)
(ii) පලිබෝධ මර්ධනය (ල. 1)
ජෛව විවිධත්ව සංරක්ෂණය වැනි නිවැරදි පිළිතුර
(iii) රතු පොල් කුරුමිණියා - කෘමි පලිබෝධ, බජිරි, කුඩමැට්ට, තුනස්ස - ශාක පලිබෝධක (ල. 2)

B (i) C (ල. 1)
(ii) ● පිරිසිදු ආහාර ලබා ගැනීමට හැකි වීම.
● අපද්‍රව්‍ය මිශ්‍ර වීම වලකී.
● සතුන්ගෙන් සිදුවන හානි වැලකේ.
● වැස්සෙන් සිදුවන හානි වැලකේ.(ල. 1)
(iii) ● ජලය ඉවත් වී ප්‍රමාණයෙන් කුඩා බවට පත් වේ. (ල. 1)
(iv) ● දුම්ගැසීම - මස්/මාළු/ගොරකා
● මී පැණි වල බහා තිබීම - වියළි මස් වර්ග
● වැලි වල බහා තිබීම - දෙහි/ඉගුරු
● ලුණු දැමීම - අඹ, දෙහි, මාළු (ල. 2)

(මුළු ලකුණු 11)

03. A (i) A - පෘථිවි
D - අඟහරු
F - සෙනසුරු (ල. 3)
(ii) අමාවක දිනය 16 (ල. 1)
(iii) අටවක/ අව අටවක
(රූපයෙන් දැක්වීමට) (ල. 1)

(iv) සූර්යයා, චන්ද්‍රයා හා පෘතුවිය පිළිවෙලින් ප්‍රමාණාත්මකව දැක්වීමට (ල. 1)
නිවැරදි කිරණ සටහනට පූර්ණ හා උපඡායා සහිත (ල. 2)



(v)
- බයිසිකල් පොම්පයක්
- මෙගා බෝතලයක්
- රබර් ඇබයක්
- වැල්ව් එකක්
- ජලය (ල. 2)

(vi) NASA (ල. 1)

(මුළු ලකුණු 11)

04. A (i) සල්ෆර්/රසදිය/යකඩ (ල. 2)
(ii) පිරිසිදු සීනි/යකඩ/රසදිය (ල. 2)
(iii) පිරිසිදු ලුණු ද්‍රාවණය/පිරිසිදු සීනි (ල. 1)
(iv) රසදිය (ල. 1)
(v) වායු අවස්ථාව (ල. 1)
(vi) සල්ෆර් (ල. 1)
(vii) යකඩ (ල. 1)

B (i) A - සංයෝග (ල. 1)
B - ලෝහ (ල. 1) (මුළු ලකුණු 11)

05. A (i) සූර්යයා (ල. 1)
(ii) ග්ලූකෝස් (ල. 1)
(iii) 21% (ල. 1)

B (i) පොලිතීන් බෑගය තුල ජල බිංදු (ල. 2)
(ii) උත්ස්වේදනය (ල. 2)

C (i) ආසුතිය (ල. 2)
(ii) බිංදුදය (ල. 2)

(මුළු ලකුණු 11)

06. A (i)
- පරීක්ෂණය කරන ලද ක්‍රමය
- ආකලන ද්‍රව්‍ය
- නිෂ්පාදිත දිනය
- කල් ඉකුත්වීමේ දිනය
- තත්ව සහතිකය (ල. 2)

(ii)
- ශීතනය
- අධිශීතනය

(iii)
- සෝඩියම් මෙටාබයි සල්ෆයිට් (ල. 2)
- සෝඩියම් බයිසල්ෆයිට්
- බෙන්සොයික් අම්ලය/ඇසිටික් අම්ලය
- සෝඩියම් ක්ලෝරයිඩ්
- සෝඩියම් නයිට්‍රයිම්/සෝඩියම නයිට්‍රේට් (ල. 2)

Answer

(iv) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ල. 1)

B (i) මිනිසාට ප්‍රයෝජනවත් වන විවිධ බෝග හා අස්වනු වලට හානි පමුණුවන ජීවීන්. (ල. 1)
(ii) බිත්තර → කීටයා → පිලවා → සුහුඹුල් පළතුරු මැස්සා (ල. 2)
(iii) රසායනික පලිබෝධ නාශකවල ඇති විෂ රසායනික සංයෝග ජල මූලාශ්‍රවලට එක්තු වී පිළිකා, වකුගඩු රෝග ආදී රෝග වැලදීමේ අවදානම (ල. 1)

(මුළු ලකුණු 11)

07. A (i) A - පෘථිවි අකුණු
B - වලා අකුණු (ල. 2)
(ii) A / පෘථිවි අකුණු (ල. 1)
(iii)
- විදුලි උපකරණ විසන්ධි කිරීම.
- රූපවාහිනී ඇන්ටනා එම යන්ත්‍ර වලින් විසන්ධි කිරීම.
- දුරකථන භාවිතයෙන් වැලකීම
- ලෝහමය උපකරණ භාවිතයෙන් වැලකීම. (ල. 1)

B (i) ගංවතුර, නායයාම් (ල. 1)
(ii)
- ස්වභාවික හේතු
- මානව ක්‍රියාකාරකම් (ල. 2)

(iii) පැසිපික් සාගරයේ මතුපිට ජලයේ උෂ්ණත්වය ඉහළ යාම සමඟ වායුගෝලීය වායු ධාරාවන්ගේ සහ සාගර දියවැල් වල සාමාන්‍ය සංසරණ රටාව වෙනස් වීම. (ල. 1)

C (i) ධ්‍රැව තාරකාව (ල. 1)
(ii) ඔරායන් / දඩයක්කාරයා (ල. 1)
(iii) තරුවක පිහිටීම නිර්ණය කිරීමට උන්නතාංශය තීරණයට කිරීමට (ල. 1)

(මුළු ලකුණු 11)